**නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ත්‍රිකුණාමලය උතුර කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පුරප්පාඩු පිරවීම - 2017**

**01.** නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ත්‍රිකුණාමලය උතුර කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරෙහි පවතින පුරප්පාඩුව පිරවීම සඳහා දැනට නැගෙනහිර පළාතේ සේවයෙහි නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2017.07.28 වේ.

**02. සුදුසුකම් :-**

i. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථිර පත්වීම් ලිපියක් ලබා දී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I/II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

ii. අයදුම්කරුවන් අදාල ශ්‍රේණියේ 2017.07.28 දිනට පූර්වාසන්න අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එම කාලය තුළ ලැබිය යුතු සියළුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම සහ කිසිදු විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැතිවීම.

iii. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 60 ට නොවැඩි වීම.

**03. බඳවා ගැනීමේ ක්‍රමය :-**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අදාළ සේවයට අයත් අයදුම්කරුවන් අතුරින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවා මෙම තනතුර සඳහා පත්කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.
(මුළු ලකුණු 100 යි)

| | | | |
|---|---|---|---|
| i. | වර්තමාන ශ්‍රේණිය | - | I ශ්‍රේණිය (ලකුණු 10) / II ශ්‍රේණිය (ලකුණු 05) |
| ii. | අධ්‍යාපන සුදුසුකම් | - | M.Ed./M Phil. (ලකුණු 10), Post Graduate Diploma (ලකුණු 08) |
| iii. | වැඩබලන තනතුරු | - | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (එක් අවුරුද්දකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 20) |
| iv. | භාෂා නිපුණතාවය | - | සිංහල හෝ දෙමළ (ලකුණු 07) , ඉංග්‍රීසි (ලකුණු 10) |
| v. | විශේෂ ජයග්‍රහණ | - | පළකිරීම් (ලකුණු 10) , පර්යේෂණ(ලකුණු 10) |
| vi. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය (ලකුණු 15) | | |

**සටහන ඃ** මෙම තනතුරට බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලබන අතර, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති අවස්ථාවක පමණක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් සලකා බලනු ලැබේ.

**04. ඉල්ලුම් කළ යුතු ආකාරය :-**

මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2017.07.28 දිනට හෝ ඊට ප්‍රථම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සංකේත අංකය **“EX/Rec/17/13”** යන්න සඳහන් කළ යුතුය.

**නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති සංකේත අංකය නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**05.** මෙම තනතුර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය අවසාන තීරණය වන අතර, මෙම පත්කිරීම් සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණු පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.